# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.

**Tel: 11 4062180-190, 011 2565304, Fax: 011 4714460, 0114503001**.

**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org


**ජනාධිපතිවරණය 2015,**

පශ්චාත් මැතිවරණ - **මාධ්‍ය නිවේදන 02**

**2015 ජනවාරි 13**

මේ වන විට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය පශ්චාත් මැතිවරණ කාල පරිච්ඡේදය සමයේ ප්‍රධාන සිද්ධීන් 27 ක් ද සුළු සිද්ධීන් 18 ක් ද ඇතුළුව සිද්ධීන් 45 ක් වාර්තාගත කර තිබේ. එබඳු සිද්ධීන්ගේ ඉහළ යාම සිත් පාරවන අතර මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ජනාධිපතිවරයාගෙන් සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ගෙන් වැඩිදුර සිද්ධීන් ඇතිවීම වැළක්වීමට කඩිනම් පියවර ගන්නැයි ද පහතින් විස්තරාත්මකව දැක්වෙන වැරදි කරන ලද්දවුන් නීතියට හමුවට ගෙන එන්නැයි ද ඉල්ලා සිටී.

**ජනවාරි 13 වෙනි දින ගාල්ලේ පෙට්‍රල් බෝම්බ ප්‍රහාරය**

අම්බලන්ගොඩ තුඩාවමුල්ලේ සජින් වාස් ගුණවර්ධන මන්ත්‍රීවරයාට අයත් නිවසකට පහර දී තිබෙන බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට වාර්තා වී ඇත. ඒ අවස්ථාවේ එහි සිටි ආරක්ෂක නියාමකවරයාට අනුව ප. ව. 8. 45 ට පමණ පෙට්‍රල් බෝම්බ තුනක් නිවසට එල්ල වී ඇති අතර ඒවායින් නිවසේ බිත්තිවලට හා ජනේලවලට හානි සිදුවී ඇත. අම්බලන්ගොඩ පොලීසියේ පොලිස් පොතේ 78, 79 හා 80 යන පිටුවල සිද්ධිය පිළිබඳව පොලිස් පැමිණිල්ලක් සටහන් කරනු ලැබ තිබේ. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට කතා කරමින් මේ වර්ගයේ ප්‍රචණ්ඩ ක්‍රියා නතර කළ යුතු බව ගුණවර්ධන මහතා පැවසීය.

**ජනවාරි 12 වෙනි දින පොලොන්නරුවේ නිවසකට ගල් ගැසීම**

අළුයම 2. 30 ට පමණ පොලොන්නරුව මැතිවරණ කොට්ඨාසයේ උඩුවෙල නව නගරයේ 15/19 C හි පදිංචි එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකාරියක වන ඩී. ආර්. අසන්තිකා මුණවීර මහත්මියගේ නිවසට ගල් ගැසූ බවට පැමිණිල්ලක් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත ලැබී ඇත. ප්‍රහාරයට ලක් වූ නිවැසියට අනුව ඒ අවස්ථාවේ ඇය සහ ඇයගේ ළමුන් දෙදෙනා නිවසේ සිට ඇත. එසේම ආසන්නයේ පිහිටි ඇගේ මවගේ නිවසට ද ගල් පහර එල්ල කර තිබේ.

**ජනවාරි 11 වෙනි දින පොලොන්නරුවේ ප්‍රහාරය**

පොලොන්නරුවේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථාන නිරීක්ෂකවරයාට අනුව පුද්ගලයින් පිරිසක් ප. ව. 1. 30 ට පමණ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන් වන ඩී. එම්. ලීලාවතී හා කේ. එම්. කරුණාරත්න යන අයවලුන්ගේ නිවසට කඩා ඇතුල් වී ඔවුන්ගේ පුතුන් දෙදෙනා ඇතුළු නිවැසියන්ට පහර දී තුවාල සිදු කර ඇත. යකඩ පොලු රැගෙන යතුරු පැදිවලින් පැමිණ තිබූ ප්‍රහාරකයින් නිවසෙහි සිටි හතර දෙනාටම පහර දී ඇත. සිදුවූ ගැටුමේ දී පාර්ශව දෙකම තුවාල ලබා ඇත. පහර කෑමට ලක් වූ සුනිල් ප්‍රේමරත්නගේ පුතුන්ගෙන් එක් පුතෙකු වන සුනිල් ප්‍රේමරත්නගේ (අවුරුදු 32) හිසට සිදු වූ බරපතල තුවාල හේතුවෙන් සිහිසුන් බවට පත්ව තිබේ. ප්‍රතිකාර සඳහා පහරකෑමට ලක්වූවන් පොලොන්නරුව රෝහළට ඇතුළත් කර තිබෙන අතර පහර දුන්නවුන් වැලිකන්ද රෝහලට ඇතුළත් කර තිබේ. කරුණාරත්න මහතා වැලිකන්ද පොලිස් ස්ථානයට අංක CIN 01 355/57 යටතේ පොලිස් පැමිණිල්ලක් ගොනු කර තිබේ. පැමිණිල්ලේ දී ඔවුන් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවන් ලෙස ප්‍රකට පුද්ගලයින් ගණනාවකට එනම් රුක්මන්, චාමර, වික්‍රම්, මංජුල, අසංක හා චානමින් ද යන අයවලුන්ට මේ සම්බන්ධයෙන් චෝදනා කර තිබේ. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථාන නිරීක්ෂකවරයාට අනුව මෙම සිද්ධිය ඇති වී ඇත්තේ ජනාධිපතිවරණයට පෙර දින (ජනවාරි 7) පහර කෑමට ලක් වූවන් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ වෙනුවෙන් ඡන්ද කටයුතුවල යෙදී සිටිය දී ඔවුන් සමග පහර දුන්නවුන් ඇති කරගත් ගැටුම දුර දිග යාමේ ප්‍රතිපලයක් වශයෙනි.

**ජනවාරි 11 වෙනි දින හලාවත එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවෙකුගේ නිවසක් ගිනිබත් කරයි.**

මෙදින ප. ව. 10. 30 ට පමණ එක්සත් ජාතික පක්ෂ ප්‍රදේශීය සභා මන්ත්‍රීවරයෙකු වන ලලිත් ආනන්ද විසින් මෙහෙයවන ලද එජාප ආධාරකරුවන් පිරිසක් විසින් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවෙකු වන උරුලියගමගේ බන්දුලගේ නිවස ගිනිබත් කරනු ලැබ තිබෙන බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත වාර්තා වී තිබේ. අංක MCR 66/62 යටතේ මාදම්පේ පොලිස් ස්ථානයට පොලිස් පැමිණිල්ලක් ගොනු කර තිබේ.

**ජනවාරි 11 වෙනි දින රක්වානේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවෙකුගේ නිවසක් ගිනිබත් කරයි.**

නිවසක් ගිනි තැබීමේ තවත් සිද්ධියක් රක්වාන ප්‍රදේශයෙන් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත වාර්තා වී තිබේ. නිවස අයත් වන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවෙකු වන එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවෙකු වන ලයනල් ප්‍රනාන්දු මහතාට ය. නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන් මේ සම්බන්ධයෙන් වග කිව යුතු යයි ඔහු සැක කරයි. ඔහු පැමිණිලි අංක MOIB 138/62 යටතේ රක්වාන පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ගොනු කර තිබේ.

**ජනවාරි 11 වෙනි දින නුවර ප්‍රහාරය**

එක්සත් ජාතික පක්ෂයේ ප්‍රකාශකයෙකු වන සුපුන් පුෂ්පකුමාර මහතාට පහර දීමක් පිළිබඳ පැමිණිල්ලක් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත ලැබී ඇත. ඔහුට තර්ජනය කර ඇත්තේ එජාප ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වන කේ. රාජනායක මහතා විසිනි. පුෂ්පකුමාර මහතාට අනුව කැබ් රථ දෙකකින් ඔහුගේ නිවසට පැමිණි ප්‍රහාරකයා හා ඔහුගේ අනුගාමිකයින් ඔහුට අඬ ගසා ඇත. ඔහු ඔවුන්ව මුණ ගැසීමට පිටතට පැමිණි විට ඔවුන් ඔහුට පහර දී අසල තිබූ අගලකට දමා ඇත. ඔහු පැමිණිලි අංක MOIB 363/21 යටතේ ගලහ පොලිස් ස්ථානයට පොලිස් පැමිණිල්ලක් ගෙනු කර තිබේ.

**ජනවාරි 11 වෙනි දින නුවර දී එජාප වාහන කණ්ඩායමකට පහර දී ඇත**

මහනුවර පාතදුම්බර දී පාතදුම්බර එජාප විපක්ෂ නායක ඒ. ජී. විජේතුංග මහතා විසින් නායකත්වය දෙන ලද වාහන කණ්ඩායමකට පහර දීමක් පිළිබඳව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට වාර්තා කෙරිණ. බස් රථයකින් ද ත්‍රිරෝද රථ 10 කින් ද ලොරි 4 කින් ද සමන්විත වාහන කණ්ඩායමට පහර දෙන විට එය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් අමතන ලද රැස්වීමකට ගොස් ආපසු එමින් සිට ඇත. විජේතුංග මහතාට අනුව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී යු. එස්. ප්‍රසන්න මහතාගේ ආධාරකරුවන් 30 ක් පමණ බසය නවත්වා ඊට පහර දී ඇත. පුද්ගලයින් 9 දෙනෙකු ජම්බුගස්පිටිය රෝහළට ඇතුළත් කර ඇති අතර පසුව පේරාදෙනිය රෝහලට මාරුකර යවා තිබේ. පැමිණිලි අංක CIB 1169/130 යටතේ පොලිස් පැමිණිල්ලක් ගොනු කර තිබේ. සැකකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන තිබෙන බව හා පුද්ගලයින් 8 දෙනෙකු පේරාදෙනිය රෝහළේ ප්‍රතිකාර ලබමින් සිටි බව වත්තේගම පොලිස් ස්ථානය විසින් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත දැනුම් දෙනු ලැබ ඇත.

**ජනවාරි 11 වෙනි දින පොලොන්නරුවේ මැදිරිගිරියේ එක්සත් ජනතා නිදහස් සන්ධාන කාර්යාලයට ගල් ප්‍රහාරයක්**

ප. ව. 1. 00 පමණ නාඳුනන කණ්ඩායමක් විසින් පොලොන්නරුවේ මැදිරිගිරියේ එක්සත් ජනතා නිදහස් සන්ධාන කාර්යාලයකට පහර දෙන ලද බව පොලොන්නරුව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථාන නිරීක්ෂකවරයෙකු වාර්තා කර ඇත. කරන ලද හානිවලට එක්සත් ජනතා නිදහස් සන්ධාන කටවුට විනාශ කිරීම ද ඇතුළත් ය.

**ජනවාරි 11 වෙනි දින පොලොන්නරුවේ නිවසකට ගල් ප්‍රහාරයක්**

ප. ව. 1. 30 ට පමණ නාඳුනන කණ්ඩායමක් විසින් පොලොන්නරුවේ නිවසකට ගල් ගසා තිබෙන බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට වාර්තා විය. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකාරියක වන අනුරාධා සඳමාලි මහත්මියට අනුව නිවසට එක දිගට විටින් විට ගල් ප්‍රහාර එල්ල වී ඇති අතර ඉන් නිවසට හානි වී ඇත. පොලිස් පැමිණිල්ලක් ගොනු කරනු ලැබ නැත.

**ජනවාරි 11 වෙනි දින අනුරාධපුරයේ තාර ප්‍රහාරයක්**

එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවෙකු වන එන්. එම්. නවරත්න බණ්ඩාගේ නිවසට (අංක 530, හුරුළු නිකවැව, ගලෙන්බිඳුනවැව) පෙ. ව. 2. 00 ට පමණ නාඳුනන පුද්ගලයින් කණ්ඩායමක් විසින් තාර ප්‍රහාරයක් එල්ල කර තිබෙන බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත වාර්තා වී ඇත.

**ජනවාරි 10 වෙනි දින ගම්පහ දී ප්‍රහාරයක්**

එක්සත් ජනතා නිදහස් සන්ධාන ආධාරකරුවෙකු වන ජාඇල සුනිත් ගුණසේකර මහතාගේ නිවසට වාහන 10 - 12 පමණ පැමිණි පිරිසක් ඔහුට, ඔහුගේ බිරිඳට හා මවට කළ පහරදීමක් පිළිබඳව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත දැනුම් දෙනු ලැබිණ. පැමිණිලි අංක CIB III 107/135 යටතේ ජාඇල පොලිස් ස්ථානයට පොලිස් පැමිණිල්ලක් ගොනු කර තිබේ. එහි දී එජාප නාගරික මන්ත්‍රී අන්ජු සැකකරු ලෙස හඳුනා ගෙන ඇත.

**ජනවාරි 10 වෙනි දින මහනුවර තර්ජනයක් හා බියවැද්දීමක්**

ප. ව. 7. 30 ට පමණ මහනුවර සොකන්චි ප්‍රාථමික පාසලට කැබ් රථයකින් පැමිණි නාඳුනන පුද්ගලයින් හතර දෙනෙකු විසින් මහාචාර්ය සුජිත් නිශ්ශංක මහතාගේ ජීවිතයට තර්ජනය එල්ලකර තිබෙන බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත වාර්තා කෙරුණි. මහාචාර්ය නිශ්ශංක මෑතක පැවති සිරස රූපවාහිනියේ වැඩ සටහනක දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජයග්‍රහණය පුරෝකථනය කර තිබුණි. පැමිණිලි අංක 119 CIB 314/11 යටතේ පොලිස් පැමිණිල්ලක් ගොනු කර තිබේ.

**ජනවාරි 9 වෙනි දින පොලොන්නරුවේ තර්ජනයක් හා බියවැද්දීමක්**

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකාරියක වන ඒ. ජී. ඩිලානි ගයා සංජීවනී මහත්මියගේ නිවස කඩා ගෙන ඇතුළුවූ පුද්ගලයින් කණ්ඩායමක් නිවැසියන්ට තර්ජනය කර තිබේ. පැමිණිලි අංක EIB 251/53 යටතේ අරලගන්විල පොලිස් ස්ථානයට පොලිස් පැමිණිල්ලක් ගොනු කර තිබේ. එහි සැකකරු ලෙස නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවෙකු වන ධර්මරත්න නමින් ප්‍රකට පුද්ගලයා නම් කර තිබේ.

ඒ හා සමාන සිදුවීමක් එදිනම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකාරියක වන දුක්ගන්නාරාළගේ බිසෝ මැණිකේ නිවසට ද එල්ල වී තිබේ. නාඳුනන පුද්ගලයින් කණ්ඩායමක් ප. ව. 9. 45 ට පමණ ඔවුන්ගේ නිවස කඩා ගෙන ඇතුළු වී දොර ජනෙල් ඇතුළු දේපළවලට හානි පමුණුවා තිබේ. පැමිණිලි අංක EIB 258/55 යටතේ අරලගන්විල පොලිස් ස්ථානයට පොලිස් පැමිණිල්ලක් ගොනු කර තිබේ.

**ජනවාරි 8 වෙනි දින මහනුවර ගම්පොල දී ඡන්ද පොල නියෝජිතයින්ට පහරදීමක්**

ගම්පොල කන්ද විහාර ගොඩනැගිල්ලේ ( Mountain Temple Building ) ඡන්ද මධ්‍යස්ථානයේ සේවයේ නියුතු ඡන්ද පොල නියෝජිතයින් තිදෙනෙකුට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නාගරික මන්ත්‍රී දර්ශන නයන තරංග හා ආධාරකරුවන් පහරදුන් බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත වාර්තා විය. එස්. ජී. එච්. එම්. ජයලාල්, එස්. එල්. බණ්ඩාර හා එස්. ප්‍රසාද් කුමාර යන තිදෙනාට පහර දී ඇත්තේ ඡන්දය ගණන් කරන මධ්‍යස්ථානවලට ඡන්ද පෙට්ටි ගෙන යාමට සූදානම් කිරීම නිමවීමත් සමග ය.

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.



ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු